
# fb මුහුණුපොතේ තිබුණි මෙසේ



අතාත්වික-Follow


# මේ තියෙන්නෙ ප්‍රින්ගල්ස්

මේ තියෙන්නෙ ප්‍රින්ගල්ස් කියන අලපෙති වගේ කෑම ජාතියක් හැමෝම කාල ඇති කියල හිතනව...

ඇත්තටම මේකෙ හැඩය අහම්බයක් නෙවෙයි. මේක සුවිශේෂී හැඩයක්. ගණිතමය වශයෙන් මේ හැඩය හයිපර්බලික් පැරබොලොයිඩ් (hyperbolic paraboloid) ලෙස හඳුන්වනවා පහළ රූපයේ තියෙන්නෙ ඒ හැඩයයි. ඔවුන්ගේ නිර්මාණකරුවන් මෙම චිප්ස් ඇසුරුම්කරණයේදී වායුගතික විද්‍යාත්මකව සහ එකමත එක චිප්ස් තැබීමේදී කැඩී නොයන ආකාරය, හැඩය නොවෙනස් වන පරිදි තබා ගැනීම වැනි දෑ අධ්‍යයනය කිරීමට සුපිරි පරිගණක භාවිතයෙන් සිදු කරනු ලැබූ බව තමයි සඳහන් වෙන්නෙ.


1956 දී පාරිභෝගිකයන්ගේ චෝදනා (ඇසුරුම් කිරීමේදී චිප්ස් පහසුවෙන් කැඩීයාම හා ඇසුරුම තුළ වාතය පිරීම වැනි දේ) මත ගැම්බල් හා ප්‍රොක්ටර් විසින් රසායන විද්‍යාඥ ෆ්‍රෙඩ්රික් ජේ. බෝර්ට මේ පිළිබඳව අධ්‍යයනය කිරීමට භාර දෙනු ලැබුවා ඔහු අවුරුදු 2ක පමණ පර්යේෂණයකින් පසු පිටිවලින් මෙම සැදෑල (අශ්වයන් පිටේ යනකොට ඔවුන්ගේ පිටේ දාල තියන ආවරණය) හැඩැති චිප්ස් නිපදවූ අතර චිප්ස් බහලුම ලෙස දිගැති සිලින්ඩරාකාර බහලුම් තෝරා ගත්තේය. පසුව යාන්ත්‍රික ඉංජිනේරුවන් විසින් මෙම හැඩය ලබාගත හැකි යන්ත්‍ර නිපදවන ලදි.

මෙය තාක්ෂණික නොවන කර්මාන්තයක ගනුදෙනුකරුවන්ගේ ගැටලු දක්ෂ ලෙස විසඳීම සඳහා දැඩි ලෙස තාක්ෂණික අවධානය යොමු කළ විසඳුමක හොඳම උදාහරණයකි.



$$= \frac{x^2}{a^2} - \frac{y^2}{b^2}, \quad \frac{x^2}{a^2} + \frac{y^2}{b^2} < 1$$








දසු-Follow

හම්බෙලා තියෙනවද ඇරියස් උඩු දුවපු මිනිස්සු ?

එක්තරා සීමාවකදී අපි හැමෝම එක එක ඇරියස් තියන මිනිස්සු තමයි... හැබැයි මේක ඊට වඩා වෙනස් තත්ත්වයක්. සමහර මිනිස්සුන්ට ජීවිතේ සෑතු ටික හරියට විඳින්න ලැබෙන්නෙ නැහැ.

නිසි කාලෙ අතේ පයේ, පොතේ දෙයක් ඉගෙනගත්ත නැති මිනිස්සු

හරියට ආදරේ කරලා, ආදරේ විඳලා නැති මිනිස්සු

තරුණ කාලේ ලස්සනට ඇඳපු පැලඳපු නැති මිනිස්සු

අධික සමාජ අසාධාරණයට ලක්වුණු මිනිස්සු

තමන් බලාපොරොත්තු වුණ විදිහේ පවුල් ජීවිතයක් නොලබපු මිනිස්සු

හෝ තමන්ගෙ ජීවිත කතා ඇතුළේ අදාළ දේවල් අදාළ කාලයට නොවිඳපු මිනිස්සුන්ගේ ඒ අහිමිවීම සහ වේදනාව දැන හෝ නොදැන පීඩනයක් විදිහට එක තැනක රැඳිලා තියෙනවා....

සමහර වේලාවට තමාවත් නොදැන ටික ටික ඕක bottle up වෙලා එක තැනකදී පිටාර යනවා...

අන්තිමට තමාවත් නොදැන ලස්සනට ජීවත්වෙන යාළුවන්ගෙන්, සල්ලි තියන සැප විඳින මිනිස්සුන්ගෙන්, ලස්සනට අඳින පලඳින ජීවිතේ විඳින කෙල්ලො කොල්ලන්ගෙන්, ලේලිලා බෑනලාගෙන්, නෑදෑහිතවතුන්ගෙන් හෝ තමන් අවට ඉන්න කාගෙන් හෝ ඕක පිටවෙනවා හෝ පිටකරනවා....

එහෙම අය මුණගැහුණම තර්ක කරන්න, උපදෙස් දෙන්න, තේරුම් කරන්න යන්න එපා...

මොකද ඒක එහෙම කරලා හොඳ කරන්න පුළුවන් තත්ත්වයක් නෙමෙයි.

ඔයා හිනා වෙලා නිශ්ශබ්දව එතැනින්, ඒ අයගෙන් බොහොම සීරුවට අයින් වෙන්න.

එහෙම මිනිස්සුන්ට ඕනෙ අනුකම්පාව....

මොකද ඇරියස් එක්ක ජීවත් වෙනවා කියන්නෙ ඔයා හිතනවට වඩා වේදනාත්මක දෙයක්... එහෙම අයට අනුකම්පා කරන්න !

-උපුටා ගැනීමකි-



Shenu perara

# ඔබේ දුවට උගන්වන්න....

ඔබේ දුවට උගන්වන්න
ඊළුපා සහ බැහැර කියන්න,
ඔබේ දුවට උගන්වන්න
අවශ්‍ය තැනදි හඬ නඟන්න,
ඔබේ දුවට උගන්වන්න
සංසුන්ව හිඳිනවා වෙනුවට රැළි
නංවන කුණාටුවක් විය යුතු මොහොතේ එසේවන්න,
ඇයට උගන්වන්න,
බොරු ආචාරශීලිත්වයට වඩා තමන්ගේ ආරක්ෂාව අගනා බව,
ඊමට උදව්වෙන්නර කියා කෑ ගසනවා වෙනුවට ඊ මම උඹට බය නැහැර යනුවෙන් කෑ ගසා, පීඩකයන් දවාලන්න,
අනෙකා විසින් ඇය පිටින් බලෙන් පටවන ලජ්ජාවෙන් තොරව ජීවත්වෙන්න,
ඇයට උගන්වන්න ඇගේ ආරක්ෂාව සහ ගෞරවය වෙනුවෙන් පළමු ප්‍රහාරය එල්ල කරන්න,
ආපසු පෙරළා සටන් කරන්නට සහ සපාකෑම්වලට සපාකෑම්වලින් පිළිතුරු දෙන්න,
ඇයට උගන්වන්න...,
ගැහැනුන්ට අයුතු ලෙස සලකන ලෝකය දවා හළු කරන්නට,
තමන්ව අපයෝජනය කෙරූ අපරාධකරුවන්ගේ නම්




මහ හඬින් කියන්නට,
තමන් පිළිබඳව දැඩි සේ වගකීම්සහගත වීමට,
භයානක ගැහැනියක් ලෙස හඳුන්වනවාට බිය නොවීමට,
තමන් පිළිබඳව ස්ථිරව සිටීමට,
තමන්ට උවමනා දේ දැන සිටීමට,
තමන් විශ්වාස කරනා මතය වෙනුවෙන් සිට ගැනීමට,
නිර්භීතව ජීවිතය අල්ලාගැනීමට,
සහ ඒ අල්ලාගත් ජීවිතය සාහසික එඩිතරබවකින් ජීවත් කරවීමට....
ඔබේ දියණියට උගන්වන්න,
ඇයට ලබා දුන් ලෝකයට වඩා යහපත් ලෝකයක් ගැන විශ්වාස කරන්නට...
ඉන්පසු ඇයට කියන්න
ඇය ඒ ලෝකය ලැබීමට සුදුසු බව...
ඇයට කියන්න, ඊ මා විඳි දුකම ඔබත් විඳිය යුතු නැති බවර
ගැහැනියක වීමේ උරුමය යනු දුකක් බව අපට කියා දුන් බොරුවක් බවත්, අපි එයට අභියෝග කරන්නට ආ බවත් ඇයට කියාදෙන්න!
ඔබේ දුවට උගන්වන්න



